# ජාතික යෞවන සම්මාන තරගාවලිය සහ ජාතික යෞවන සම්මාන උළෙල - 2018

ජාතික තරුණ සේවා සභාව මගින් වාර්ෂිකව සංවිධානය කොට පවත්වනු ලබන ජාතික යෞවන සම්මාන තරගාවලිය සහ යෞවන සම්මාන උළෙල මෙවරද 40වන වරටත් පැවැත්වීමට කටයුතු යොදා ඇත. දිස්ත්‍රික්, පළාත් සහ ජාතික වශයෙන් සිංහල/දමිළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන් යෞවන සම්මාන තරගාවලිය පැවැත්වේ.

මෙම තරගාවලිය පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියාත්මක වේ.

## 01. <u>යෞවන සම්මාන තරගාවලියට අදාළ පොදු උපදෙස්</u>

1.1. 2018 යෞවන සම්මාන තරගාවලියේ, සාමාන්‍ය තරග වයස **අවුරුදු 13 - 29** අතර ද, නාට්‍ය තරග හා නාට්‍ය විචාර තරග වයස **අවුරුදු 15 -35** අතර තරුණ තරුණියන් සඳහා ද සංවිධානය කෙරේ.

1.2. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය **2018.04.02 වේ.**

1.3. යෞවන සම්මාන තරගාවලිය දිස්ත්‍රික්, පළාත් සහ ජාතික වශයෙන් අදියර තුනකින් ද, යොවුන් නාට්‍ය තරගාවලිය හා යෞවන සම්මාන උළෙල පළාත් සහ ජාතික වශයෙන් ද පැවැත්වේ.

1.4. සාහිත්‍ය තරගාවලිය පැවැත්වෙන්නේ ජාතික මට්ටමින් පමණි.

1.5. චිත්‍ර,ඡායාරූප,මූර්ති,කැටයම් හා ලිඛිත නිර්මාණ තරග අංශ සඳහා ඉදිරිපත්වන තරග කරුවන්ට එක් අංශයකින් උපරිම නිර්මාණ 05 ක් බැගින් ඉදිරිපත් කල හැකිය.

1.6. දිස්ත්‍රික, පළාත් සහ ජාතික තරග සඳහා නියමිත වයස් සීමාව තුළ සිටින අයදුම්කරුවන් පමණක් සහභාගි කරවීමට හා මෙම උපදෙස් පත්‍රිකාවේ සඳහන් තරග අංශ පමණක් පැවැත්වීමට අවධානය යොමු කළ යුතුය.

1.7. **නාට්‍ය අංශයේ සහ නාට්‍ය විචාර අංශයේ තරග කරුවන්ගේ වයස** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2018.04.02 වන දිනට **අවුරුදු 15 - 35 ත්** අතර (1983.04.02 දිනට පසු හා 2003.04.02 දිනට පෙර උපන් අය විය යුතුය)

1.8. **අනෙකුත් සියළුම තරග සඳහා වයස** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2018.04.02 වන දිනට **අවුරුදු 13 - 29 ත් අතර වීම.** (1989.04.02 දිනට පසු හා 2005.04.02 දිනට පෙර උපන් අය විය යුතුය).

1.9. සෑම තරගකරුවෙක්ම දිස්ත්‍රික, පළාත් සහ ජාතික තරග සඳහා ඉදිරිපත් වීමේදී තම අනන්‍යතාවය සහ වයස සනාථ කළ යුතුය. ඒ සඳහා ජාතික හැඳුනුම්පත හෝ තැපැල් හැඳුනුම්පත හෝ ගුවන් ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ උප්පැන්න සහතිකයෙහි මුල් පිටපත (එහි ඡායා පිටපතක් ද සමග) අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, විහාරාධිපති හෝ රජයේ පිළිගත් විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කරන ලද සෙන්ටිමීටර 8.25 x 5.72 ප්‍රමාණයේ ඡායාරූපයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. තම අනන්‍යතාවය නියමිත පරිදි තහවුරු කිරීමට අපොහොසත් තරගකරුවන්ට කිසිම හේතුවක් මත තරගාවලියට ඉදිරිපත් වීමට අවස්ථාව නොලැබේ.

1.10. යෞවන සම්මාන තරග පෙ.ව.9.00 සිට ප.ව.3.30 දක්වා පමණක් පැවැත්වේ. තරග සඳහා ලියාපදිංචි කිරීම පෙ.ව.8.30 සිට පෙ.ව.10.30 දක්වා පමණක් සිදු කළ යුතුය.

1.11 ලියාපදිංචි කිරීමේ කාලය තුළ දී ලියාපදිංචි වී ඇති සියළුම තරගකරුවන් අදාළ තරග අංශ සඳහා ඉදිරිපත් වී ඇත්නම් තරග අවසන් කිරීම අදාළ පළාත් අධ්‍යක්ෂවරයාගේ හෝ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත සිදු කළ හැකිය.

1.12. ලියාපදිංචියේ සිට විනාඩි 10ක් ඇතුලත තරගකරුවන් තරග සඳහා ඉදිරිපත් විය යුතුය. නියමිත කාලය තුළ දී තරගයට ඉදිරිපත් නොවන තරගකරුවන් හෝ කණ්ඩායම් තරගයෙන් ඉවත්වත් කිරීමේ බලය සංවිධායක මණ්ඩලය සතු වේ.

1.13. සියළුම ඒකල සහ කණ්ඩායම් තරගකරුවන් (අයදුම්කරුවන්) අදාල දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (කණ්ඩායම් තරග සඳහා අයදුම් කිරීමේ දී අයදුම්කරු කණ්ඩායම් නායකයා විය යුතු අතර ඔහු/ඇය අදාල දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. කණ්ඩායමේ නායකයාට හෝ සාමාජිකයන්ට අදාළ කණ්ඩායම් තරග ශීර්ෂය වෙනත් දිස්ත්‍රික්කයකින් නියෝජනය කළ නොහැක.) එක් තරගකරුවෙකුට / කණ්ඩායම් සාමාජිකයකුට එක් තරග අංශයක් නියෝජනය කරමින් සහභාගී විය හැක්කේ එක් දිස්ත්‍රික්කයකින් පමණි. *(සැ.යු. කණ්ඩායම් නායක අතිරේක තරගකරුවකු නොවිය යුතුය)*

1.14. නර්තන / සංගීත තරග අංශයන් හි සහය ගායන හා වාදන ශිල්පීන් සඳහා සහතික පත්‍ර හෝ සම්මාන හිමි නොවේ.

1.15. සියළුම නැටුම්, ගායනා සහ වාදන තරග සඳහා සහාය ගායනා හා වාදන ශිල්පීන්ට වයස් සීමාව අදාල නොවන අතර ඒ සඳහා සාමාජිකයින් උපරිම හය දෙනෙකු යොදවා ගත හැකිය.

1.16. සියළුම තරගකරුවන් සහ සහය ශිල්පීන් විනයගරුකව තරගාවලිය සඳහා ඉදිරිපත් විය යුතුය.

1.17 තරගාවලිය සම්බන්ධ තොරතුරු සහ චක්‍රලේඛ උපදෙස් www.nysc.lk වෙබ් අඩවිය මගින් ලබා ගත හැකි අතර අයදුම්පත්‍ර යොමු කිරීම adaesthetic@nysc.lk විද්‍යුත් තැපෑල මගින් ද සිදු කළ හැකිය.

1.18. ජාතික යෞවන සම්මාන තරගයන් හි නර්තන තරග පහත සඳහන් උපදෙස් අනුව පැවැත්විය යුතුය.

1.18.1. යෞවන සම්මාන - 2018 තරග ලේඛණයේ සඳහන් නැටුම් අංශයේ තරග පමණක් පැවැත්වෙන අතර, අදාළ නැටුම්වල සම්ප්‍රදායන්ට අනුකූලව නැටුම් ඉදිරිපත් කළ යුතුය.

1.18.2. උඩරට, පහතරට, සබරගමු නැටුම් අංශයන්ගෙන් ඒකල, සමූහ (කාන්තා/පිරිමි), මිශ්‍ර වශයෙන් ද ජන නැටුම් හා නව නිර්මාණ නැටුම් සමූහ (කාන්තා/පිරිමි) හා මිශ්‍ර වශයෙන් ද භරත හා කථක් නැටුම් ඒකල වශයෙන්ද පැවැත්වේ.

1.18.3. නර්තන අංශ සඳහා කාලය අවම විනාඩි 05 ත් උපරිම විනාඩි 07 ත් අතර විය යුතුය.

1.18.4. සමූහ හා මිශ්‍ර තරග සඳහා කණ්ඩායමක සාමාජිකයින් ගණන අවම 6 ක් හා උපරිම 12 ක් විය යුතු අතර මිශ්‍ර තරග සඳහා කාන්තා හා පිරිමි සම සමව ඇතුලත් විය යුතුය.

1.18.5. සමූහ සහ මිශ්‍ර තරග සඳහා උපරිම සංඛ්‍යාවට අමතරව සාමාජිකයින් 04 දෙනෙකු (මිශ්‍ර තරග සඳහා කාන්තා 02, පිරිමි 02 වශයෙන්) ආදේශ වශයෙන් නම් කල හැකි අතර එකී නම් පළාත් හා දිස්ත්‍රික් අයදුම් පත්‍ර ලේඛනයේ ඇතුලත් විය යුතුය. ආදේශ කල හැක්කේ එසේ නම් කළ සාමාජිකයින් පමණි. ආදේශ ලෙස නම් කොට නොමැති කිසිදු තරගකරුවකුට තරගයට ඉදිරිපත්විය නොහැක.

1.18.6. සියළුම නැටුම් තරග අදාල රංග වස්ත්‍රාභරණයෙන් සැරසී ඉදිරිපත් කළ යුතු අතර සහය බෙර වාදන ශිල්පීන් අදාළ වස්ත්‍රාභරණයෙන් සැරසී සිටිය යුතුය.

1.18.7. උඩරට, පහතරට හා සබරගමු නැටුම් වලට පටිගත කරන ලද සංගීතය භාවිතා කළ නොහැකි අතර නව නිර්මාණ, ජන නැටුම්, භරත හා කථක් නැටුම් සඳහා පටිගත කරන ලද සංගීතය භාවිතා කළ හැකිය.

1.19. ශාස්ත්‍රීය වාදනය හා බටහිර වාදනය තරග සඳහා ඉදිරිපත්වීමේ කාලය අවම විනාඩි 05 ක් හා උපරිම විනාඩි 07 ත් අතර වේ. ශාස්ත්‍රීය වාදන සඳහා සුදුසු ගැලපෙන ඇඳුමක් භාවිතා කළ යුතුය.

1.20. නර්තන හා සංගීත සඳහා වාදන භාණ්ඩ සහ සහය වාදන ශිල්පීන් අදාල තරගකරුවන් විසින් සපයා ගත යුතුය.

## <u>02. යෞවන සම්මාන දිස්ත්‍රික්,පළාත් හා ජාතික තරගාවලියේ පැවැත්වෙන තරග</u>

### 2.1. <u>සිංහල මාධ්‍ය තරග</u>

| | | | | |
|---|---|---|---|---|
| 01. | උඩරට නැටුම් (ශාස්ත්‍රීය) | - | ඒකල (කාන්තා) | කොහොඹා හැල්ල |
| | | - | ඒකල (පිරිමි) | තිත් මාත්‍රා (ගායනා සහිත) |
| | | - | සමූහ (කාන්තා) | අසදෘශ වන්නම |
| | | - | සමූහ (පිරිමි) | යක් ඇනුම |
| | | - | මිශ්‍ර | කෝල්මුර |
| 02. | පහතරට නැටුම් (ශාස්ත්‍රීය) | - | ඒකල (කාන්තා) | පත්තිනි නර්තනය |
| | | - | ඒකල (පිරිමි) | තෙල්මෙ |
| | | - | සමූහ (කාන්තා) | සුරඹාවල්ලි |
| | | - | සමූහ (පිරිමි) | ලිව්ජවි |
| | | - | මිශ්‍ර | යහන් දැක්ම |
| 03. | සබරගමු නැටුම් (ශාස්ත්‍රීය) | - | ඒකල (කාන්තා) | කෙණ්ඩි පාලිය |
| | | - | ඒකල (පිරිමි) | දළුමුර පාලිය |
| | | - | සමූහ (කාන්තා) | තිසරා වන්නම |
| | | - | සමූහ (පිරිමි) | සමන් දෙවි මල් අස්න |
| | | - | මිශ්‍ර | අත්මිණී උපත |
| 04. | ජන නැටුම් | - | සමූහ (කාන්තා) | ගොයම් නැටුම |
| | | - | සමූහ (පිරිමි) | පතුරු නැටුම |
| | | - | මිශ්‍ර | ලී කෙලි නැටුම |
| 05. | නව නිර්මාණ නැටුම් | - | මිශ්‍ර, සමූහ (කාන්තා) හා සමූහ(පිරිමි) | |

මෙතෙක් නව නිර්මාණ යටතේ ඉදිරිපත් වී ඇති නිර්මාණ අංග හෝ ජනප්‍රිය ගීත සහ පවතින වන්නම් වලට සිදු කරන නිර්මාණ මෙම තරග ශීර්ෂයට ඉදිරිපත් නොකල යුතු අතර ඔබගේ නිර්මාණය පටිගත කළ හෝ නොකළ සංගීතය යොදා ගනිමින් සිදු කෙරෙන නවතම නිර්මාණාත්මක නර්තනාංගයක් විය යුතුය.

| | | | |
|---|---|---|---|
| 06. | නිවේදක | | |
| 07. | කථික | | |
| 08. | යොවුන් ගායන ශිල්පී | - විවිධ ශෛලියේ විවිධ රිද්මයේ ගීත ගායනා කිරීම | |
| 09. | ජන ගායනා | - ඒකල(කාන්තා) | ඔංචිලිවාරම්, ලී කෙළි, තාලම්, ගොයම් ආශ්‍රයෙන් ජන ගායනා |
| | | - ඒකල (පිරිමි) | ටීකා, රබන්, පතල්, ධීවර, ගැල් කවි ආශ්‍රිත ජන ගායනා |

(ආඝාතාත්මක හා අනාඝාතාත්මක වශයෙන් නාදමාලා ඇතුලත් වන සේ ගායනා කල යුතුය. කාලය උපරිම විනාඩි 5 කි. සුදුසු අවනද්ධ බෙර හා තාලම්පට භාවිත කල හැකිය.)

10. බෙර වාදන — සියලුම බෙර වාදන තරග අංශ සඳහා තරගකරුවන් අනුරූප වන අන්දමේ රංගවස්ත්‍රාභරණ වලින් සැරසී සිටිය යුතුය.

<u>ඒකල බෙර වාදනය සඳහා කාලය උපරිම විනාඩි 05- 07 කි.</u>

| | | | |
|---|---|---|---|
| 01 | උඩරට මගුල් බෙර වාදනය | - | ඒකල - කාන්තා, පිරිමි |
| 02 | පහතරට මගුල් බෙර වාදනය | - | ඒකල - කාන්තා, පිරිමි |
| 03 | සබරගමුව මංගල දවුල් වාදනය | - | ඒකල - කාන්තා, පිරිමි |
| 04 | තම්මැට්ටම් වාදනය | - | ඒකල - කාන්තා, පිරිමි |

තම්මැට්ටම් වාදනය වලිනඩ, ගමන් හේවිසි ඇතුලත් කරමින් වාදකයාගේ ශිල්පීය දක්ෂතාව පෙන්වන ආකාරයෙන් ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ. (සහය වාදනය සඳහා දවුල සහ හොරණෑව භාවිත කළ හැකිය).

ඒකල වාදන සඳහා තරගකරුට අමතරව සහය ශිල්පීන් තිදෙනෙකු පමණක් සහභාගි කරවා ගත හැකිය.

<u>සමූහ හා මිශ්‍ර බෙර වාදනය සඳහා කාලය විනාඩි 05 - 07 අතර වේ</u>

05 සමූහ කාන්තා, සමූහ පිරිමි හා මිශ්‍ර බෙර වාදනය

- කණ්ඩායමක සාමාජිකයන් අවම 6 - උපරිම 14 ත් අතර විය යුතුය.
- මිශ්‍ර තරග අංශයට කාන්තා පිරිමි සම සමව විය යුතුය
- අවම වශයෙන් තාල රූප 3 ක් භාවිතා කල යුතුය
- යම් කිසි තේමාවකට අනුව ඉදිරිපත් කල යුතුය
- ආදේශ භාණ්ඩ භාවිතා කල හැකිය

## 2.2. <u>දමිල මාධ්‍ය තරග</u>

| | | | |
|---|---|---|---|
| 01. | නිවේදක | | |
| 02. | කථික | | |
| 03. | යොවුන් ගායන ශිල්පී | - | විවිධ ශෛලියේ විවිධ රිද්මයේ ගීත ගායනා කිරීම |
| 04. | ජන ගායනා | - | ඒකල කාන්තා - ගොයම් කවි, ඔන්චිලි වාරම් කවි |
| | | - | ඒකල පිරිමි - ධීවර ගී, ගොයම් කවි |

(ආඝාතාත්මක හා අනාඝාතාත්මක වශයෙන් නාදමාලා ඇතුලත් වන සේ ගායනා කල යුතුය. කාලය උපරිම විනාඩි 5 කි. සුදුසු අවනද්ධ බෙර හා තාලම්පට භාවිත කල හැකිය)

| | | | | |
|---|---|---|---|---|
| 05. | ජන නැටුම් | - | සමූහ (කාන්තා) | කුම්මි |
| | | - | සමූහ (පිරිමි) | කාවඩි නඩනම් |
| | | - | මිශ්‍ර | මීනව නඩනම් |
| 06. | නව නිර්මාණ නැටුම් | - | මිශ්‍ර, සමූහ (කාන්තා) හා සමූහ(පිරිමි) | |

මෙතෙක් නව නිර්මාණ යටතේ ඉදිරිපත් වී ඇති නිර්මාණ අංශ හෝ ජනප්‍රිය ගීත වලට සිදු කරන නිර්මාණ මෙම තරග ශිර්ෂයට ඉදිරිපත් නොකල යුතු අතර ඔබගේ නිර්මාණය පටිගත කළ හෝ නොකළ සංගීතය යොදා ගනිමින් සිදු කෙරෙන නවතම නිර්මාණාත්මක නර්තනාංගයක් විය යුතුය.

## 2.3. <u>සිංහල හා දමිල මාධ්‍ය පොදු තරග</u>

| | | | | |
|---|---|---|---|---|
| 01. | භරත නැටුම් | - | ඒකල (කාන්තා) | තිල්ලානා |
| | | - | ඒකල (පිරිමි) | තාන්ඩවම් |
| 02. | කථක් නැටුම් | - | ඒකල (කාන්තා) | තුම්රි |
| | | - | ඒකල (පිරිමි) | තරානා |
| 03. | අභිරූපන රංගන | - | රංගනය විනාඩි (05 - 07 අතර විය යුතුය) | |

| | | | |
|---|---|---|---|
| 04. | ශාස්ත්‍රීය ගායනා<br>(උත්තර භාරතීය රාගධාරී) | - | ඒකල (කාන්තා) / ඒකල (පිරිමි)<br>ඉදිරිපත් කිරීම උත්තර භාරතීය රාගධාරී සංගීතය අනුව විය යුතුය.<br>(කාලය විනාඩි 05 - 07) |
| 05. | ශාස්ත්‍රීය ගායනා<br>(දක්ෂිණ භාරතීය රාගධාරී) | - | ඒකල (කාන්තා) / ඒකල (පිරිමි)<br>ඉදිරිපත් කිරීම දක්ෂිණ භාරතීය රාගධාරී සංගීතය අනුව විය යුතුය.<br>(කාලය විනාඩි 05 - 07) |
| 06. | ශාස්ත්‍රීය වාදන | - | සර්පිනා, තබ්ලා, වයලීන්, සිතාර්, බටනලා, මෘදංගම්, තවිල්, එක්ස්රාජ්, වීණා<br>(කාලය විනාඩි 05 - 07) |
| 07. | බටහිර වාදන | - | ඕගන්, ගිටාර්, ඩ්‍රම්ස්, ඇකෝඩියන්, වයලීන්, බ්‍රාස් (Brass), වුඩ් වින්ඩ් (woodwind)<br>(කාලය විනාඩි 05 - 07) |
| 08. | චිත්‍ර | - | ප්‍රකාශන චිත්‍ර, සාම්ප්‍රදායික චිත්‍ර, මෝස්තර සහ ග්‍රැෆික්<br>(තෙල් සායම්, දිය සායම්, මිශ්‍ර මාධ්‍ය හෝ වෙනත් ඕනෑම මාධ්‍යයක් භාවිතා කල හැකිය.<br>ප්‍රමාණය අඟල් 17×24) |
| 09. | ඡායාරූප | - | කළු සුදු හා වර්ණ - ප්‍රමාණය අවම අඟල් 10×12 හා උපරිම අඟල් 16×20 |
| 10. | මූර්ති, කැටයම් | - | දැව, ලෝහ හෝ පුළුස්සන ලද මැටි (ටෙරා කොටා) විම<br>(චිත්‍ර හා ඡායාරූප වීදුරු නොයෙදූ රාමු සහිතව භාර දිය යුතුය) |

*ඉහත 2.3. 08,09 සහ 10 යටතේ ඇති තරග දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් පමණක් පැවැත්වේ.*

## 2.4. <u>ඉංග්‍රීසි මාධ්‍ය තරග</u>

01. නිවේදක
02. කථික
03. යොවුන් ගායන ශිල්පී

## 2.5. <u>විශේෂ අවශ්‍යතාවන් සහිත අයදුම්කරුවන්ගේ තරග</u>

### *2.5.1. සිංහල මාධ්‍ය*

| | | | |
|---|---|---|---|
| 01 | නව නිර්මාණ නැටුම් | - | ඒකල (කාන්තා) |
| | | - | ඒකල (පිරිමි)<br>ඔබගේ නිර්මාණය පටිගත කළ හෝ නොකළ සංගීතය යොදා ගනිමින් සිදු කෙරෙන නවතම නිර්මාණාත්මක නර්තනාංගයක් විය යුතුය. |
| 02. | නිවේදක | - | කථන අපහසුතා නොවන අය විය යුතුය |
| 03. | කථික | - | කථන අපහසුතා නොවන අය විය යුතුය |
| 04. | යොවුන් ගායන ශිල්පී | - | කථන අපහසුතා නොවන අය විය යුතුය<br>විවිධ ශෛලියේ විවිධ රිද්මයේ ගීත ගායනා කිරීම |
| 05. | ජන ගායනා ඒකල(කාන්තා/පිරිමි) | | කථන අපහසුතා නොවන අය විය යුතුය<br>(කාලය විනාඩි 05 - 07ත් අතර) |

### *2.5.2. දමිල මාධ්‍ය තරග*

| | | | |
|---|---|---|---|
| 01. | නව නිර්මාණ නැටුම් | - | ඒකල (කාන්තා) |
| | | - | ඒකල (පිරිමි)<br>ඔබගේ නිර්මාණය පටිගත කළ හෝ නොකළ සංගීතය යොදා ගනිමින් සිදු කෙරෙන නවතම නිර්මාණාත්මක නර්තනාංගයක් විය යුතුය. |
| 02. | නිවේදක | - | කථන අපහසුතා නොවන අය විය යුතුය |
| 03. | කථික | - | කථන අපහසුතා නොවන අය විය යුතුය |
| 04. | යොවුන් ගායන ශිල්පී | - | කථන අපහසුතා නොවන අය විය යුතුය<br>විවිධ ශෛලියේ විවිධ රිද්මයේ ගීත ගායනා කිරීම |
| 05. | ජන ගායනා ඒකල(කාන්තා/පිරිමි) | | කථන අපහසුතා නොවන අය විය යුතුය (කාලය විනාඩි 05 - 07ත් අතර) |

### *2.5.3. විශේෂ අවශ්‍යතාවයන් සහිත අයදුම්කරුවන්ගේ සිංහල හා දමිල මාධ්‍ය පොදු තරග (බාධිත තරුණ තරුණියන් සඳහා පැවැත්වෙන තරග)*

| | | | |
|---|---|---|---|
| 01. | චිත්‍ර | - | ප්‍රකාශන චිත්‍ර (තෙල් සායම්, දිය සායම් හෝ මිශ්‍ර මාධ්‍ය භාවිතා කල යුතුය, ප්‍රමාණය අඟල් 17×24)<br>(චිත්‍ර හා ඡායාරූප වීදුරු නොයෙදූ රාමු සහිතව භාර දිය යුතුය) |

*ඉහත 2.5.3. - 01 යටතේ ඇති තරග දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් පමණක් පැවැත්වේ.*

2.6. සාහිත්‍ය තරගඅංශ සඳහා ඉදිරිපත් කර ඇති නිර්මාණ ජාතික තරග සඳහා නියමිත දිනට පෙර දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ මගින් සහකාර අධ්‍යක්ෂ (සංස්කෘතික) වෙත යොමු කළ යුතුය.

03. <u>යෞවන සම්මාන ජාතික තරගාවලිය</u>

3.1. යෞවන සම්මාන ජාතික තරග පැවැත්වෙන්නේ ජාතික තරුණ සේවා සභාව මගින් නියම කරනුලබන දිනයන්හි දී පමණක්වන අතර එම දිනයන්හිදී තරගකරුවන් තරගය සඳහා සහභාගී වියයුතුය. නියමිත දිනට සහභාගී නොවන තරගකරුවන් සඳහා නැවත දිනක දී එම තරගය පැවැත්වීමට කටයුතු කරනු නොලැබේ.

3.2. සාහිත්‍ය තරග අංශය සඳහා වන නවකථා, කෙටිකථා, ගද්‍ය රචනා, පද්‍ය රචනා, ගිත රචනා, ළමා සාහිත්‍ය කෘති හා මුද්‍රිත කෘති ඇගයීම යන තරග ජාතික මට්ටමින් පමණක් පැවැත්වේ.

04. <u>යෞවන සම්මාන ජාතික තරගාවලියේ පැවැත්වෙන තරග</u>

අංක 02 හි සඳහන් දිස්ත්‍රික සහ පළාත් තරගාලියට අදාල සියලුම තරග පැවැත්වෙන අතර ඒ හැරුණුවිට ජාතික මට්ටමින් පහත තරග ද පැවැත්වේ.

4.1. <u>සිංහල මාධ්‍ය තරග</u>

සාහිත්‍ය තරග අංශය — නවකථා

ළමා සාහිත්‍ය කෘති

*(නවකථා සහ ළමා සාහිත්‍ය කෘති අත්පිටපත් තරගයකි. කවර නිර්මාණය සහ පෙරවදන් පසු වදන් ඇතුලත්ව මුද්‍රණය සඳහා පිළියෙල කළ අංග සම්පූර්ණ අත් පිටපතක් විය යුතුය. ළමා සාහිත්‍ය කෘතිවල දී අදාළ පිටකවරය මෙන්ම ඇතුලත චිත්‍ර ද ඇතුලත් කර තිබිය යුතුය.)*

කෙටිකථා - *මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය.*

පද්‍ය රචනා - *කැමති ඕනෑම කාව්‍ය ආකෘතියකින් නිර්මාණ ඉදිරිපතක් කළ හැකි අතර එවා මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය.*

ගීත රචනා - *පැටිගත කර මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය.*

ගද්‍ය රචනා - *වචන 1000 - 1500 අතර*

- ගද්‍ය රචනා හැර අනෙකුත් සාහිත්‍ය නිර්මාණ කැමති ඕනෑම වස්තු විෂයයක් පාදක කරගනිමින් නිර්මාණය කළ හැකිය. නිර්මාණ තුළින් මානව ගුණධර්ම අභියෝගයට ලක් නොකළ යුතුය.

(A4 ප්‍රමාණයේ කඩදාසියක තනි පැත්තේ පැහැදිලි අත් අකුරින් හෝ පරිගනකගත කර සෑම නිර්මාණයක්ම පිටපත් 03 කින් එවිය යුතුය. නිර්මාණයේ කිසිදු තැනක නම සඳහන් නොකල යුතුය.)

4.2. <u>දමිල මාධ්‍ය තරග</u>

සාහිත්‍ය තරග අංශය — නවකථා

ළමා සාහිත්‍ය කෘති

*(නවකථා සහ ළමා සාහිත්‍ය කෘති අත්පිටපත් තරගයකි. කවර නිර්මාණය සහ පෙරවදන් පසු වදන් ඇතුලත්ව මුද්‍රණය සඳහා පිළියෙල කළ අංග සම්පූර්ණ අත් පිටපතක් විය යුතුය. ළමා සාහිත්‍ය කෘතිවල දී අදාළ පිටකවරය මෙන්ම ඇතුලත චිත්‍ර ද ඇතුලත් කර තිබිය යුතුය.)*

කෙටිකථා - *මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය.*

පද්‍ය රචනා - *කැමති ඕනෑම කාව්‍ය ආකෘතියකින් නිර්මාණ ඉදිරිපතක් කළ හැකි අතර එවා මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය.*

ගීත රචනා - *පැටිගත කර මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය.*

ගද්‍ය රචනා - *වචන 1000 - 1500 අතර*

- ගද්‍ය රචනා හැර අනෙකුත් සාහිත්‍ය නිර්මාණ කැමති ඕනෑම වස්තු විෂයයක් පාදක කරගනිමින් නිර්මාණය කළ හැකිය. නිර්මාණ තුළින් මානව ගුණධර්ම අභියෝගයට ලක් නොකළ යුතුය.

(A4 ප්‍රමාණයේ කඩදාසියක තනි පැත්තේ පැහැදිලි අත් අකුරින් හෝ පරිගනකගත කර සෑම නිර්මාණයක්ම පිටපත් 03 කින් එවිය යුතුය. නිර්මාණයේ කිසිදු තැනක නම සදහන් නොකල යුතුය.)

**4.3. <u>ඉංග්‍රීසි මාධ්‍ය තරග</u>**

සාහිත්‍ය තරග අංශය

කෙටිකථා (Short Story) - *මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය.*

පද්‍ය රචනා (Poem) - *කැමති ඕනෑම කාව්‍ය ආකෘතියකින් නිර්මාණ ඉදිරිපතක් කළ හැකි අතර එවා මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය.*

ගීත රචනා (Lyrics) - *තැටිගත කර මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් නොකළ නිර්මාණයක් විය යුතුය.*

- සාහිත්‍ය නිර්මාණ කැමති ඕනෑම වස්තු විෂයයක් පාදක කරගනිමින් නිර්මාණය කළ හැකිය. නිර්මාණ තුළින් මානව ගුණධර්ම අභියෝගයට ලක් නොකළ යුතුය.

(A4 ප්‍රමාණයේ කඩදාසියක තනි පැත්තේ පැහැදිලි අත් අකුරින් හෝ පරිගනකගත කර සෑම නිර්මාණයක්ම පිටපත් 03 කින් එවිය යුතුය. නිර්මාණයේ කිසිදු තැනක නම සදහන් නොකල යුතුය.)

4.4. සිංහල හා දෙමළ මාධ්‍ය - ගද්‍ය රචනා පහත තේමාවන්ට අනුකූල විය යුතුය.

<u>ගද්‍ය රචනා</u>

1. තාරුණ්‍ය
2. සොහොදහම
3. ප්‍රේමය
4. තාක්ෂණය
5. දේශාභිමානය

**4.5. <u>යොවුන් නාට්‍ය විචාරක තරගය</u>**

ජාතික යොවුන් නාට්‍ය උළෙල තරඹා එහි දී ප්‍රදර්ශනය වූ නාට්‍යක් පිළිබදව කරනු ලබන වචන 1000ත් - 1500ත් අතර නාට්‍ය විචාරය. (2018 ජාතික යොවුන් නාට්‍ය තරගාවලිය අවසන් වී දින 14ක් ඇතුලත සිංහල හෝ දෙමල මධ්‍යයෙන් පිටපත් 03 කින් යුත් විචාරය සහකාර අධ්‍යක්ෂ (සංස්කෘතික) - ජාතික තරුණ සේවා සභාව, මහරගම වෙත අයදුම් පත්‍රය ද සමග භාර දිය යුතුය.

4.6. විශිෂ්ඨතම මුද්‍රිත කෘතින් ඇගයීම (සිංහල / දමිල / ඉංග්‍රීසි) - හොදම නවකතාව, කෙටිකතා සංග්‍රහය, හොදම කාව්‍ය සංග්‍රහය (වයස අවුරුදු 15ත් - 35ත් අතර තරුණ නිර්මාණ කරුවන්ට අයදුම් කළ හැකිය. 2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රකාශිත මුද්‍රත කෘතින් පමණක් මේ සදහා ඉදිරිපත් කළ හැකිය. සෑම නිර්මාණකරුවකුම අයදුම් පත්‍රය සමග තම නිර්මාණ සංග්‍රහයේ පිටපත් 03ක් ඉදිරිපත් කළ යුතුය.)

**05. <u>ජාතික යොවුන් නාට්‍ය තරගාවලිය</u>**

5.1. යොවුන් නාට්‍ය උළෙලේ ගුණාත්මක භාවය රදවා ගනිමින් උසස් මට්ටමින් යුත් ආධුනික නිර්මාණකරුවන් ජාතික තලය දක්වා රැගෙන එම ජාතික තරුණ සේවා සභාවේ ජාතික අවශ්‍යතාවයක් සේ සලකන අතර ඒ අනුව අංකුර නිර්මාණකරුවන් දිරිගැන්වීම සදහා පළාත් මට්ටමින් දක්ෂතා අගයමින් සම්මාන පිරිනැමීමට තීරණය කර ඇත. ඒ යටතේ පහත අංශයන් පළාත් සහ ජාතික මට්ටමින් ඇගයීමට අපේක්ෂිතය.

5.2. ජාතික යොවුන් නාට්‍ය තරගාවලිය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් දිගු නාට්‍ය හා කෙටි නාට්‍ය තරගාවලියක් වශයෙන් පැවැත්වේ.

5.3. දිගු නාට්‍ය හා කෙටි නාට්‍ය අංශය සදහා ඉදිරිපත් කරන නිර්මාණ පැහැදිලි අත් අකුරින් හෝ පරිගණක අකුරු වලින් සකස් කර එක් නිර්මාණයකින් පිටපත් 03 බැගින් ඉදිරිපත් කළ යුතුය. දිගු නාට්‍ය පැය 1ත් පැය 2 1/2 ත් අතර ද කෙටි නාට්‍ය විනාඩි 15ත් - 30ත් අතර ද විය යුතුය. (විස්තර අයදුම් පත්‍රයේ සදහන් කළ යුතු අතර නාට්‍ය පිටපතෙහි රචකයාගේ විස්තර සදහන් නොකල යුතුය.)

5.4. පහත අංශයන්ගෙන් ඇගයීම සිදු කෙරේ.

5.4.1 කෙටි නට්‍ය - සිංහල මාධ්‍ය හා දෙමල මාධ්‍ය, දිගු නාට්‍ය - සිංහල මාධ්‍ය

- හොදම නිශ්පාදනය - ප්‍රථම දෙවන සහ තෙවන
- හොදම රචනය - ප්‍රථම දෙවන සහ තෙවන
- හොදම නළුවා සහ හොදම නිළිය
- හොදම සහය නළුවා සහ හොදම සහය නිළිය

5.4.2 අනුශාංගික ශිල්පි ඇගයීම

- හොඳම සංගීතය
- හොඳම ඇඳුම් නිර්මාණය
- හොඳම පසුතල නිර්මාණය
- හොඳම අංග රචනය
- හොඳම වේදිකා පරිපාලනය
- හොඳම ආලෝකකරණය
- හොඳම රංග වින්‍යාසය
- ජූරියේ විශේෂ ඇගයීම (උපරිම සම්මාන සංඛ්‍යාව 03ක්)
- නිර්දේශ සඳහා විශිෂ්ට රංග කුසලතා (සහතික පමණි)
- කුසලතා සහතික

ඉහත සම්මාන ප්‍රදානයේ දී එක් එක් ඇගයීම් අංශයන් සඳහා ඇගයීමට ලක්වන්නේ එක් අයෙක් පමණි. එසේ වුව ද විනිශ්චය මණ්ඩලය සෑහීමකට පත්වන අවස්ථාවක දී පමණක් ඉහත 5.4.1. හි ඇතුලත් හොඳම නිෂ්පාදනය සහ 5.4.2. ඇතුලත් අනුශාංගික ශිල්පි ඇගයීම සඳහා දෙදෙනෙකුට උපරිම ලෙස දායක විය හැකිය.

5.5. ජාතික තරුණ සේවා සභාව විසින් පනවන කොන්දේසිවලට අනුව නාට්‍ය නිර්මාණය ඉදිරිපත් කළ යුතුය. නාට්‍ය නිර්මාණය තුළ මත්ද්‍රව්‍ය මත්පැන් භාවිතය සජීවීව ප්‍රදර්ශණය කෙරෙන දර්ශන ඇතුලත් කිරීම නොකළ යුතුය.

සියළුම අයදුම්කරුවන් සහ සහභාගිකයින් 2018 යෞවන සම්මාන සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛ නියෝගවලට අනුව පමණක් තරග සඳහා ඉදිරිපත්විය යුතුය. අයදුම්කරුවන්ගේ නම**,** ලිපිනය**,** උපන්දිනය**,** දුරකථන අංකය**,** දිස්ත්‍රික්කය**,** යෞවන සමාජයේ නම**,** ඉදිරිපත් වන තරග අංශය හා නිර්මාණයේ නමත් ඇතුලත් විය යුතුය**.** අයදුම්පත්‍රය අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයා වෙත හෝ තම ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ තරුණ සේවා නිලධාරී වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය හැකිය**.**

සභාපති/අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික තරුණ සේවා සභාව,
මහරගම.

**විමසීම්**

සහකාර අධ්‍යක්ෂ (සංස්කෘතික)
ජාතික තරුණ සේවා සභාව,
අංක.65, හයිලෙවල් පාර, මහරගම.

දුරකථන අංකය - 0112850996 (දිගුව 312) හෝ 0113 185700

Email – adaesthetic@nysc.lk
Web – www.nysc.lk

<u>ඔබගේ අයදුම්පත්‍ර යොමු කළ යුතු ජාතික තරුණ සේවා සභාවේ දිස්ත්‍රික් කාර්යාල ලිපිනයන්</u>

| | | |
|---|---|---|
| සහකාරඅධ්‍යක්ෂ(නාගරික තරුණයා),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය, කච්චේරිය,<br>කොළඹ 12. | සහකාර අධ්‍යක්ෂ(මන්නාරම),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>දිසාපති කාර්යාලය,<br>මන්නාරම | සහකාර අධ්‍යක්ෂ (මාතර),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>අංක 155/ඒ 3, හක්මන පාර,<br>ගබඩා විදිය, මාතර. |
| සහකාර අධ්‍යක්ෂ (කොළඹ),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>අංක 65, හයිලෙවල් පාර,<br>මහරගම. | සහකාර අධ්‍යක්ෂ (අම්පාර),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>අංක සී/16, නව නගරය,<br>අම්පාර. | සහකාර අධ්‍යක්ෂ (වව්නියාව),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>රම්‍යා නිවාස අසල,<br>නුවර පාර, වව්නියාව. |
| සහකාර අධ්‍යක්ෂ (ගම්පහ),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>වලච්චත්ත, ගම්පහ. | සහකාර අධ්‍යක්ෂ (මඩකළපුව),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>පයනියර් පාර, මඩකළපුව. | සහකාර අධ්‍යක්ෂ (කෑගල්ල),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>කෑගලු කණිෂ්ඨ විද්‍යාල පාර, කෑගල්ල. |
| සහකාර අධ්‍යක්ෂ (කළුතර),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලයල,<br>නාගොඩ පාර, කළුතර. | සහකාර අධ්‍යක්ෂ(ත්‍රිකුණාමලය),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>දිසාපති කාර්යාලය, ත්‍රිකුණාමළය. | සහකාර අධ්‍යක්ෂ (පුත්තලම),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>හලාවත. |
| සහකාර අධ්‍යක්ෂ (මහනුවර),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය 04 වන මහල,<br>නව මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,<br>යටිනුවර වීදිය, මහනුවර. | සහකාර අධ්‍යක්ෂ (අනුරාධපුරය),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>කඩ දොළහ පිටුපස,<br>නව නගරය, අනුරාධපුරය. | සහකාර අධ්‍යක්ෂ (බදුල්ල),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>අංක 37/13, ග්‍රීන් ලේන් ඩ්‍රයිව්,<br>බදුලු පිටිය, බදුල්ල. |
| සහකාර අධ්‍යක්ෂ (මාතලේ),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>දිසාපති කාර්යාලය,<br>මාතලේ. | සහකාර අධ්‍යක්ෂ (පොළොන්නරුව),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>නව නගරය,<br>පොළොන්නරුව. | සහකාර අධ්‍යක්ෂ(මොණරාගල),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>කුමාර වත්ත, කච්චේරිය හන්දිය,<br>මොණරාගල. |
| සහකාර අධ්‍යක්ෂ (නුවරඑළිය),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>ඇස්ලි හවුස් ගාඩින්ස්,<br>ලේඩි මැක්ලන් ඩ්‍රයිව්, නුවරඑළිය. | සහකාර අධ්‍යක්ෂ (කුරුණෑගල),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>මීගමු පාර,<br>මල්කඩුවාව, කුරුණෑගල. | සහකාර අධ්‍යක්ෂ(රත්නපුර),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>දිසාපති මැදුර අසල,<br>නව නගරය, රත්නපුරය. |
| සහකාර අධ්‍යක්ෂ (ගාල්ල),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>අංක 65, පෙට්ටිගල වත්ත, ගාල්ල. | සහකාර අධ්‍යක්ෂ (කිළිනොච්චිය),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>නුවර පාර, පරන්තන්. | සහකාර අධ්‍යක්ෂ (හම්බන්තොට),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>බටඅත, හුංගම. |
| සහකාර අධ්‍යක්ෂ මුලතිව්),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>දිසාපති කාර්යාලය,<br>මුලතිව්. | සහකාර අධ්‍යක්ෂ (යාපනය),<br>ජාතික තරුණ සේවා සභාව,<br>දිස්ත්‍රික් කාර්යාලය,<br>නිවාස ලේකම් කාර්යාලය,<br>නුවර පාර, යාපනය. | |

ඇමුණුම - ආදර්ශ අයදුම් පත්‍රය

ලියාපදිංචි අංකය [ ]

# ජාතික යෞවන සම්මාන තරගාවලිය - 2018

## ................................................ තරගය සඳහා අයදුම්පත්‍රය

## (එක් තරගයක් සඳහා එක් අයදුම්පතක් භාවිතා කළ යුතුය)

**වයස් සීමාව -** නාට්‍ය අංශය අවුරුදු 15 - 35 (උපන් දිනය 1983.04.02 - 2003.04.02 අතර)

අනෙකුත් තරග සඳහා වයස අවුරුදු 13 - 29 (උපන් දිනය 1989.04.02 - 200504.02 අතර)

**තරග මාධ්‍ය -** සිංහල/දමිල/ ඉංග්‍රීසි/විශේෂ අවශ්‍යතා සහිත සිංහල/දමිළ (අනවශ්‍ය දෑ කපා හරින්න)

01 සම්පූර්ණ නම : ................................................................................................

02 මුලකුරු සමග නම :- ................................................................................................

03 ස්ථිර ලිපිනය :-................................................................................................

04 දුරකථන අංකය :- ................................................................................................

05 උපන් දිනය :- ................................................................................................

06 2018.02.28 දිනට වයස :- ................................................................................................

07 ජාතික හැදුනුම්පත් අංකය :- ................................................................................................

08 දිස්ත්‍රික්කය :- ........................

09 සාමාජිකත්වය දරණ යෞවන සමාජයේ නම :- ..........................................................................

10 තරග මාධ්‍ය :- සිංහල / දෙමළ / ඉංග්‍රීසි/ විශේෂ අවශ්‍යතා සහිත (සිංහල / දෙමල)

11 නිර්මාණ ඉදිරිපත් කරන්නේ නම් *(එක් එක් නිර්මාණ සඳහා අයදුම්පත්‍ර වෙන් වෙන් වශයෙන් භාවිත කරන්න)*

1. නිර්මාණයේ නම :- ........................................................................

12 නාට්‍ය හා කෙටි නාට්‍ය පිටපතේ නම :- ........................................................................

(සෑම ලිඛිත නිර්මාණයක්ම පිටපත් 03 කින් ඉදිරිපත් කළ යුතුය. අයදුම් පත්‍රයේ පිටපතක් නිර්මාණයෙහි පිටුපස අලවන්න)

ජාතික තරුණ සේවා සභාව විසින් සංවිධානය කරනු ලබන 2018 ජාතික යෞවන සම්මාන තරගයට මා විසින් ඉදිරිපත් කළ කරුණු සත්‍ය බවත් මෙම තරගයේ දී ජාතික තරුණ සේවා සභාවේ නීති රෙගුලාසි හා තීරණ වලට එකඟ වන බවත් විනිශ්චයමණ්ඩලය විසින් ලබා දෙන තරිණය අවසන් තීරණය වශයෙන් පිළිගන්නා බවක් මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :- ...................................

.......................................

අයදුම්කරුගේ අත්සන